සන්නස
SANNASA

## විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

### සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව




> "අනුකම්පාවට..?
> ඔයාට පිස්සුද ස්නේහා..
> එහෙමත් අනුකම්පාවට
> පඩි වැඩි කරන
> කොම්පැණි මේ
> තුන් ලෝකෙ කොහේවත්
> තියේවිද?"

මේනක දොස්තර මහත්තයා බොහෝ වේලාවක් යනතෙක් කතා නොකළේ ය. ඔහුට කල්පනා කරන්නට බොහෝ දේ තිබුණි. ස්නේහා කී දේ ගැන පමණක් නො වේ. ඇය ගැන ද කල්පනා කරන්ට බොහෝ කරුනු කාරණා ඔහුගේ සිතේ විය.

තිස්ස දෙවේලේ හමුවන ඉහළ පැලැන්තියේ දොස්තර නෝනලා ඇතුලු ප්‍රභූ කාන්තාවන් කෙරෙන් නොදුටු වෙනත්ම සුන්දරත්වයක් මේ දුප්පත් කෙල්ල වෙතින් ඔහුට පෙනෙයි. ඇයට ආරක්ෂකයකු විය යුතු යයි ඔහුගේ සිත කියයි.

"ඇයි සර් කල්පනා කරන්නෙ..? මං කතා කරනවා වැඩියි නේද..?" ස්නේහා ඇසුවේ බොහෝ වේලාවකට පසුව ය. ඔහු හිස හරවා ඇය දෙස බැලුවේ ය. ඔහුගේ මුහුණේ තිබුණේ බැරෑරුම් පෙනුමකි.

"මං කල්පනා කළේ ඔයා ගැන"
ඔහු කීවේ ය.

"මං ගැන" ඇය ඇසුවේ පුදුමයෙනි. "..
මං ගැන මොනා කල්පනා කරන්නද?"

ඔහු කිසිවක් නොකීවේ ය. වාහනය චීන අවන්හලේ මහ ගේට්ටුවෙන් ඇතුල්වුණේ ඒ වෙලාවේදීම ය. මේනක නැවත කතා කළේ ආපනශාලාවේ ඔවුන් වෙනුවෙන් වෙන්වුණ මේසයේ අසුන්ගත්තාට පසුව ය.

"ඇයි ස්නේහා මං හොයල දුන්න හොස්පිටල් එකට යන්න අකැමැති වුණේ?" ඔහු ඇසුවේ ය. ඔහුට දිය යුතු පිලිතුර කුමක්දැයි ස්නේහා කල්පනා කරමින් සිටියා ය. ඒ රැකියාවට නොගියේ ඔහු හා සමීප වීම නොකළ යුතු දෙයකැයි සිත කී නිසා ය. ඒ බව කියා ඔහුගේ සිත රිදවන්නට ඇයට නොසිතෙයි.

"මං හිතුව ස්ර්ට කරදරයක් නොවී ඉන්න එක හොඳයි කියල" ඈ කල්පනාවෙන් පසුව කීවා ය.

"ස්නේහ ඒ හොස්පිටල් එකට ගියාම මොකක්ද මට වෙන කරදරේ?" ඔහු ඇසුවේ ය.

"සර් නොකිව්වට කරදරයක් වෙනවා තමයි.. අන්තිමේ සර්ට නැති කරදර වෙයි.. මං ඒකයි පරණ තැනටම යන්න හිතුවෙ.. සර් දන්නවද? මගෙ පඩියත් වැඩි කළා"

"කෙහෙල්මල් සල්ලි නෙවෙයි වැදගත් ස්නේහා.. මං වෙන තැනකට යන්න කිව්වෙ හුඟක් කල්පනා කරලා.. ඒ මිනිස්සු පඩි නෙවෙයි තවත් ඔයා ඉල්ලන ඉල්ලන දේ දෙයි ඔයාව එතන තියාගන්න" ඔහු කීවේ කෝපයෙන් යයි ස්නේහාට සිතුනි.
"මාව එතන තියාගන්න ඒ අයට ඒ හැටි තියෙන ඕනෙ කම මොකක්ද සර්.. මං මේ පුංචිම පුංචි නර්ස් කෙනෙක් විතරයි.. මං දොස්තර නෝනා කෙනෙක් නං ඔන්න කමක් නෑ.. මං වගේ කෙනෙක් තියාගත්ත කියල ය. "ඒකයි කල්පනා කරන්න ඕනෙ"
"මාත් ඒක කල්පනා කරනවා සර්" ස්නේහා කීවා ය. "..මං හිතුවෙ මාව අසාධාරණ විදිහට ගෙදර යවලා ඒ අය කළ දේ ගැන පසුතැවිල්ලකට වගේ කළ පඩි වැඩිකිරීමක් කියලා"




එයාලට තියෙන වාසිය මොකක්ද?"

මේනක ස්නේහා දෙස හෙලුවේ තියුණු බැල්මකි.

"ඒ ප්‍රශ්නෙ ඔයා මගෙන් නෙවෙයි අහන්න ඕනෙ.. ඔයාගෙන්මයි.." ඔහු කීවේ ය.

"මට තේරුණේ නැහැ සර්" ස්නේහා මිමිණුවා ය.

"ඇයි ඒ අය ඔයාට මේ හැටි වැඩි පඩියක් දීලා ආපහු රස්සාවට ගත්තෙ?" ඔහු ඇසුවේ මේනක උපහාසාත්මක සිනහවක් මුවට නගා ගත්තේ ය.
"අනුකම්පාවට..? ඔයාට පිස්සුද ස්නේහා.. එහෙමත් අනුකම්පාවට පඩි වැඩි කරන කොම්පැණි මේ තුන් ලෝකෙ කොහේවත් තියේවිද?" ඔහු උපහාසාත්මක ස්වරයෙන් ඇසුවේ ය.

"මට තේරෙන්නෙ නැහැ සර්.." ස්නේහා හැඬුම්බරව කීවා ය. "අනේ මට මේවා තේරෙන්නෙ නැහැ සර්"

ඔහු සිය දකුණත මේසය මත වූ ස්නේහාගේ දකුණත මත තැබුවේ ය. ඔහුගේ අත උණුසුම් ය. ස්නේහා ගල් පිලිමයක් සේ නිසොල්මන්ව බලා සිටියා ය.

"මොකද මේ කඳුළු පුරෝගත්තෙ..? දැන් මෙතන අඬන්නෙ එහෙම නෑ.." ඔහු තරවටු කරන්නා සේ කීවේ ය. ඉන් පසු සීරුවෙන් තම අත ඉවතට ගත්තේ ය. "ඔයාට නො තේරෙන දේ තියෙනවා කියලා මං දන්න නිසා තමයි මං තකහනියක් ඔයාලගෙ ගෙදර හොයාගෙන ඇවිත් කිව්වෙ මං ඔයාට තැනක් හොයා ගත්තා කියලා.. මං ඒ වෙලාවෙත් දැනගෙන හිටියා මේ අය ආ යම ඔයාව රස්සාවට ගන්නවා කියලා.. ඒක වළක්වන්න තමයි මට ඕනෙ වුණේ"

මේ සියලු සිදුවීම් අතරේ යම්කිසි සැඟවුණ යමක් ඇතැයි දැන් ස්නේහාට ද සිතෙයි. අකරුණාවන්ත ලෙස තමා රැකියාවෙන් ඉවත් කළ තැනටම නැවත යාමෙන් තමා අනුවණ කමක් කරගත්තේ ද  යන පැනයට පිළිතුරක් ඇය නොදනියි. මේනක යමක් දන්නා නමුත් ඔහු එය නොකියා ඉන්නේ මන්දැයි ඇයට නොවැටහෙයි.

"මං දන්නැති යමක් සර් දන්නවා නම් අනේ මට කියන්න" ස්නේහා බැගෑපත් වූවා ය. ඔහු යමක් කියන්ට පෙර ආපනශාලා සේව කයෙක් කෑම බඳුන් කීපයක් ඔවුන් ඉදිරියේ තැබුවේ ය.

"කන්න" මේනක කීවේ ය. ස්නේහා කෑම දෙස නොබලා ඔහු දෙස බලා සිටියා ය. "කන්න ළමයෝ" ඔහු නැවත කීවේ ය.

"කන්න පුලුවන්.. එයිට ඉස්සෙල්ල සර් මගෙන් හංගන්න හදන දේ කියන්න" ස්නේහා මුරණ්ඩු ලෙස කීවා ය. ඔහු සිනාසුණේ ය.

"සමහර වෙලාවට කේන්තිත් යනව නේද?" ඔහු ඒ සිනාවෙන්ම ඇසුවේ ය. ස්නේහා සිනාසුණේ නැත.

"මේ අහන්න" ඔහු කීවේ ය. "..දැන් අපි කලබල වෙලා මෙතන ප්‍රශ්න හදාගන්න ඕනෙ නැහැ.. කලබල නොවී එය කරගෙන යන විදිහට ඔය රස්සාව කරගෙන යන්න.. හැබැයි එක දෙයක්.. මට හැම දෙයක්ම කියන්න"

"ඇයි මං හැම දෙයක්ම සර්ට කියන්න ඕනෙ?"

"ඒ මං ඔයාව ආරක්ෂා කරන නිසා"

**මතු සම්බන්ධයි**

